33 වන පිටෙන්

වදකයන් ඔහුට බැටන් පොලුවලින් හිසට පහරදීම් කරඇත. ලේ ගැලීම වැලක්වීම පිණිස ඔවුහු ඔහුගේ හිස මත පොතක් තබා ඉන්පසුව ප්‍රහාර එල්ලකර තිබේ. එහෙත් එල්5 මහතාට කම්පනය, වේදනාව හා ස්ඵුරණය දැනුනි. 1990 දී නිදහස ලැබීමෙන් පසු ඔහු හුදකලා දිවියක් ගතකලේය. 2001 දී ඔහු මනෝවිද්‍යාත්මක වෛද්‍ය පරීක්ෂණයකට ලක්කරනු ලැබූ අතර, එම අගැයුම අනුව ඔහු නපුරු සිහින දැකීම, ආක්‍රාන්තිය, අනිද්‍රාව, ලිංගික බෙලහීනතාවයෙන් හා වරින්වර සිදුවන හිසරදයෙන් පෙලෙන්නෙකි.

## ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රැඳෙවියෙකුගේ කථාව

ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ 1993 මුල් භායයේදී කේ3 මහතාව වවුනියාවේදී අත්අඩංගුවට ගෙන තිබේ. ඔහු සිය අත්දැකීම් පහත දැක්වෙන අයුරින් විස්තර කරයි:

අත්අඩංගුවට ගත් පසු මාව ....... කඳවුරට ගෙනයනු ලදුව දින කීපයකට පෙර ඇතිවූ ක්ලේමෝ බෝම්බ පිපිරීමක් ගැන මගෙන් ප්‍රශ්ණ කරණ ලදී. එම පිපිරීම ගැන මට අවබෝධයක් තිබුනේ නැත. ඔවුහු මාහට කුප්‍රකට ධර්මචක්‍ර වදය පමුණවන ලදී. මගේ දෑත් හා දෙපා ධර්මචක්‍ර සංකේතයක් මෙන් බැඳතිබුන අතර, මගේ සිරුර කරකවනවාත් සමග දෙදෙනෙක් පොලුකැබලිවලින් මගේ යටි පතුල්වලට පහර දුන්හ. ඉන් පසුව ඔවුහු මගෙන් විවිධ ප්‍රශ්ණ ඇසූහ. මා අන්දමන්ද වූ අතර, මා තදබල ලෙස වේදනාවෙන් පෙලුනෙමි.

මේසයක් මත මුණින් අතර වැතිරීමට මට අණකරනු ලැබූ අතර ඔවුහු මගේ පිටට, දෙපාවලට හා යටිපතුල්වලට පොලුවලින් හා එස්ලොන් බටවලින් පහර දුන්හ. සිද්ධීන් කීපයකට පසු යුද හමුදා රහස් ඔත්තු අංශයේ යහපත් නිලධාරියෙකු වන මේජර්---------විසින් මගෙන් ප්‍රශ්ණ කරණලදී. අදාල ත්‍රස්තවාදී ක්‍රියාව ගැන මගේ සම්බන්ධයක් නොතිබුණ බව ඔහු දැන සිටියේය. මාව නිදහස් කරන මෙන් ඔහු නියෝග කලේය. මේජර් --------- නොසිටින්නට මා මරණයට ලක්විමට ඉඩතිබුණි.

නිදහස ලැබීමෙන් පසු මාහට වැඩක යෙදීමට නොහැකිවූ අතර, සුලු වශයෙන් හෝ සිරුර වෙහෙසීම මට මහත් වේදනාවක් ගෙනදුනි. මට නින්ද නොගිය අතර සෑම රැයක්ම මා ගතකලේ බියෙනි. ඔවුන් මාව නැවතත් අත්අඩංගුවට ගනීවි යන පැහැදිලිකල නොහැකි බියකින් මම පෙලුනෙමි. ධර්මචක්‍ර වධක්‍රමය ගැන මානසික චිත්‍ර මට පෙනුන අතර පිටපිටම එම වේදනාකාරී සිද්ධිය මම නැවත මානසිකව අත්වින්දෙමි. ජීවිතය ගැන තවදුරටත් මා තුල උනන්දුවක් නොවිය. මගේ දරු පවුල ගැන මා හට කිසිම තැකීමක් නොවිය. මගේ ජීවිතය දෙදරමින් තිබුණි------

ළබන කළාපයට

## එසඳ සඳ ළඟ

තැනි බිම් සොයා දුව යන
සඳ දිය අතරමං වෙද
දෙනයන පුරුදු නැති සඳ
කම්පිත තුසර සැලුවෙද

තුත්තිරි ඇනෙන බිම මත
වැතිරී සුවය පැතුවෙද
සමබිම කොතැන තිබුණි ද
සොයා යන්නට හැකි වෙද

ඇඳි බොඳ රුවක සඳ මත
ඇස් කෙවෙනි යට සැංගෙන
කඳුලක රසය දැනුණේ ද
නොදැනුනා ලෙස සිටියෙද

අඳුරු අහුමුලු තැන තැන
සිතක සිතුවිලි සැංගෙන
නොදැක නොදැනම කිසිවිට
සඳ දිය කොතැන ගැලුවෙද

**ජගත් ජේ. එදිරිසිංහ**




# Do You Want To Migrate To Australia?

**For All Your Australian Migration Visa Requirements**

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

**We provide professional and cost effective service to our clients.**
**Step by step assistance and guidance until the end.**

## Ananda Kumarasiri
**Australian Migration Consultant**
Dip. Marketing
Grd. Cert. Imm. Law -VU
MIB (Inr.Trade) –DU

**Contact Details:**
No 1 Heathcote Court,Endeavour Hills,Vic 3802,Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden,Battaramulla,Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com



**Professional dedication to make your dreams become a reality.**

MASS Design - Sri Lanka. www.massadvertising.net / www.mass.lk / admass@sltnet.lk